## 1. මූල්‍ය ප්‍රකාශන

### 1.1 අභිතකර මතය

ජාතික ජලජ සම්පත් පර්යේෂණ හා සංවර්ධන නියෝජිතායතනයේ 2018 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය කාර්යසාධන ප්‍රකාශනය, හිමිකම් වෙනස්වීමේ ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා මුදල් ප්‍රවාහ ප්‍රකාශනය සහ මූල්‍ය ප්‍රකාශනවලට අදාළ සටහන්, සාරාංශගත වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්තිවලින් සමන්විත 2018 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාව සමඟ සංයෝජිතව කියවිය යුතු 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ සහ 1971 අංක 38 දරන මුදල් පනතේ විධිවිධාන ප්‍රකාරව මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත්කළ යුතු යැයි මා අදහස් කරන මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ දැක්වේ.

මෙම වාර්තාවේ 1.5 ඡේදයේ දක්වා ඇති කරුණු හේතුවෙන් නියෝජිතායතනයේ 2018 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරිත්වය හා මුදල් ප්‍රවාහ ශ්‍රී ලංකා රාජ්‍ය අංශයේ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු නොකරන බව මා දරන්නාවූ මතය වේ.

### 1.2 අභිතකර මතය සඳහා පදනම

ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර.) අනුකූලව මා විගණනය සිදු කරන ලදි. මෙම විගණන ප්‍රමිති යටතේ වූ මාගේ වගකීම, මෙම වාර්තාවේ මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම යන කොටසේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

### 1.3 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ සහ ඊට සම්බන්ධ පාර්ශවයන්ගේ වගකීම්

මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවනු පිණිස අවශ්‍යවන අභ්‍යන්තර පාලනයන් තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේදී, නියෝජිතායතනය අඛණ්ඩව පවත්වාගෙන යාමේ හැකියාව තීරණය කිරීම කළමනාකරණයේ වගකීමක් වන අතර, කළමනාකාරීත්වය නියෝජිතායතනය ඈවර කිරීමට අදහස් කරන්නේ නම් හෝ වෙනත් විකල්පයක් නොමැති විටදී මෙහෙයුම් නැවැත්වීමට කටයුතු කරන්නේ නම් හැර අඛණ්ඩ පැවැත්මේ පදනම මත ගිණුම් තැබීම හා නියෝජිතායතනයේ අඛණ්ඩ පැවැත්මට අදාළ කරුණු අනාවරණය කිරීමද කළමනාකරණයේ වගකීමකි.

නියෝජිතායතනයේ මූල්‍ය වාර්තාකරණ ක්‍රියාවලිය සම්බන්ධ වගකීම, සම්බන්ධ පාර්ශව විසින් දරනු ලබයි.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16 (1) උප වගන්තිය ප්‍රකාරව, නියෝජිතායතනයේ වාර්ෂික සහ කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකි වන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වාගෙන යා යුතුයි.

## 1.4 මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම

---

සමස්තයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා සහ වැරදි නිසා ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණකගේ වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතික වීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සෑම විටම ප්‍රමාණාත්මක අවප්‍රකාශයන් අනාවරණය කරගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක අවප්‍රකාශයන් ඇතිවිය හැකි අතර, මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කරගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි බලපෑමක් විය හැකි බව අපේක්ෂා කෙරේ.

මා විසින් වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය කරන ලදි. තවද,

- වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගේ අවදානම් හඳුනාගැනීමේදී හා තක්සේරු කිරීමේදී අවස්ථාවෝචිතව උචිත විගණන පටිපාටි සැලසුම් කිරීමෙන් වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවන්නාවූ අවදානම් මඟහරවා ගැනීමට, ප්‍රමාණවත් සහ සුදුසු විගණන සාක්ෂි ලබාගැනීම මාගේ මතයට පදනම් වේ. වරදක් නිසා සිදුවන බලපෑමට වඩා වංචාවක් හේතුවෙන් සිදුකරන ලද ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයක් හඳුනා නොගැනීම මගින් සිදුවන්නාවූ බලපෑම ප්‍රබල වන අතර, දුස්සන්ධානය, ව්‍යාජ ලේඛන සැකසීම, චේතනාන්විත මඟහැරීම හෝ අභ්‍යන්තර පාලනයන් මඟහැරීම වංචාවක් ඇතිවීමට හේතුවේ.

- අවස්ථාවෝචිතව උචිත විගණන පටිපාටි සැලසුම් කිරීම පිණිස සමාගමේ අභ්‍යන්තර පාලනය සම්බන්ධයෙන් අවබෝධයක් ලබා ගන්නා ලද නමුත්, අභ්‍යන්තර පාලනයේ සඵලදායීත්වය පිළිබඳ මතයක් ප්‍රකාශ කිරීමට අදහස් නොකරයි.

- කළමනාකරණය විසින් අනුගමනය කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය සහ යොදා ගන්නා ලද ගිණුම්කරණ ඇස්තමේන්තුවල හා සම්බන්ධිත හෙළිදරව් කිරීම්වල සාධාරණත්වය ඇගයීම.

- සිද්ධීන් හෝ තත්ත්වයන් හේතුවෙන් සමාගමේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ ප්‍රමාණාත්මක අවිනිශ්චිතතාවයක් තිබේද යන්න සම්බන්ධයෙන් ලබාගත් විගණන සාක්ෂි මත පදනම්ව ගිණුම්කරණය සඳහා ආයතනයේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ පදනම යොදා ගැනීමේ අදාළත්වය තීරණය කරන ලදි. ප්‍රමාණවත් අවිනිශ්චිතාවයක් ඇති බවට මා නිගමනය කරන්නේ නම් මූල්‍ය ප්‍රකාශනවල ඒ සම්බන්ධයෙන් වූ හෙළිදරව්කිරීම් වලට මාගේ විගණන වාර්තාවේ අවධානය යොමු කළ යුතු අතර, එම හෙළිදරව් කිරීම ප්‍රමාණවත් නොවන්නේ නම් මාගේ මතය විකරණය කළ යුතු වේ. මාගේ නිගමනයන් විගණකගේ වාර්තාවේ දිනය දක්වා ලබා ගන්නා ලද විගණන සාක්ෂි මත පදනම් වේ. කෙසේ වුවද, අනාගත සිද්ධීන් හෝ තත්ත්වයන් මත අඛණ්ඩ පැවැත්ම අවසන් වීමට හැකිය.

- හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය සහ අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණ අයුරින් මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත් බව ඇගයීම.

හැකිතාක් දුරට හා අවශ්‍ය ඕනෑම විටෙක පහත සඳහන් දෑ පරීක්ෂා කිරීම සඳහා විගණන විෂය පථයද පුළුල් කර ඇත.

- තොරතුරු ඉදිරිපත් කිරීම සම්බන්ධයෙන් බලන කළ නියෝජිතායතනයේ කාර්යයන් අඛණ්ඩව ඇගයීමට හැකිවන පරිදි එහි සංවිධානය, පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි විධිමත්ව හා ප්‍රමාණාත්මකව සැලසුම් කර තිබේද යන බව සහ එකී පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි ඵලදායී ලෙස පවත්වාගෙන යනු ලැබේ ද යන බව,

- යම් අදාළ ලිඛිත නීතියකට හෝ නියෝජිතායතනයේ පාලක මණ්ඩලය විසින් නිකුත් කරන ලද වෙනත් පොදු හෝ විශේෂ විධානයකට අනුකූලව, නියෝජිතායතනය ක්‍රියාකර ඇති බව,
- සිය බලතල, කර්තව්‍ය සහ කාර්යයන්ට අනුකූලව කටයුතු කර ඇති බව,
- සම්පත් පිරිමැසුම්දායීව, කාර්යක්ෂම ලෙස සහ ඵලදායී ලෙස කාලසීමාවන් තුළ සහ අදාළ නීතිරීතිවලට අනුකූලව ප්‍රසම්පාදනය කර භාවිතා කර ඇති බව.

### 1.5 මූල්‍ය ප්‍රකාශන

#### 1.5.1 මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම පිළිබඳ අභ්‍යන්තර පාලනය

ගනුදෙනු කළමනාකාරීත්වයේ පොදු සහ නිශ්චිත අධිකාරීබලය සහිතව ක්‍රියාත්මක කිරීම, අදාළ වන වාර්තාකරණ ප්‍රමිතිවලට අනුකූලව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට අවශ්‍ය වන පරිදි ගනුදෙනු සටහන් කිරීම සහ වත්කම් සඳහා ගිණුම් කටයුතුභාවය පවත්වාගෙන යාම, කළමනාකාරීත්වයේ පොදු සහ නිශ්චිත අධිකාරී බලය සහිතව පමණක් වත්කම්වලට ප්‍රවේශ වීම, සටහන් කරන ලද වත්කම් සඳහා වූ ගිණුම්කටයුතුභාවය පවත්නා වත්කම් සමඟ සාධාරණ කාල වකවානුවලදී සැසඳීම සහ වෙනස්කම් ඇතොත් ඒවා සම්බන්ධයෙන් නිසි පියවර ගැනීම ආදිය සඳහා සාධාරණ තහවුරුවක් ලබාගැනීමට ප්‍රමාණවත් "මනාලෙස සැලසුම් කරන ලද" අභ්‍යන්තර ගිණුම්කරණ පාලන පද්ධතියක් ආයතනය විසින් පවත්වාගෙන යාම අවශ්‍ය වේ.

#### 1.5.2 ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූල නොවීම

| | අදාළ ප්‍රමිතියට යොමුව සහිතව අනුකූල නොවීම | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිත අංක 02 ට පටහැනිව මෝටර් රථ විකිණීමේ ලාභය වූ රු.8,619,377 හා ඉදිරියට කළ ගෙවීම් වලින් ජනිත වූ රු.5,937,115 ක් මුදල් ප්‍රවාහය මෙහෙයුම් කටයුතු වලින් ලද මුදල් ප්‍රවාහයට වැරදි ලෙස ගලපා තිබුණි. එසේම මූල්‍ය කටයුතු වලින් ජනිත වූ හා ආයෝජන කටයුතු වලින් පිටතට ගලා ගිය මුදල් ප්‍රවාහය පිළිවෙලින් රු.19,791,500 ක් හා රු.2,463,876 ක් මූල්‍ය ප්‍රවාහ ප්‍රකාශයට ගලපා නොතිබුණු අතර ස්ථාවර වත්කම් සඳහා ආයෝජිත මුදල් ප්‍රමාණය රු.22,207,418 කින් වැඩියෙන් දක්වා තිබුණි. තවද වර්ෂයේ මුදල් හා මුදල් සමානදෑහි වෙනස් වීම ශූන්‍ය අගයක් වූවද, එය රු.34,686,128 ක් වැරදි සහගත ලෙස පෙන්වා තිබුණි. | මෙම වරද ඉදිරියේදී නිවැරදි කිරීමට කටයුතු කරනු ලැබේ. | ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිත අංක 02 අනුව මුදල් ප්‍රවාහ සකස් කල යුතු වේ. |

| | | | |
|---|---|---|---|
| (ආ) | ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිත අංක 07 හි නියමයන්ට පටහැනිව වත්කම් සඳහා රු.2,279,180 වැඩියෙන් ක්ෂය ගණනය කර මූල්‍ය ප්‍රකාශනවල දක්වා තිබුණි. ප්‍රමිතයේ 92 (ඇ) ඡේදය අනුව සමාලෝචිත වර්ෂය තුලදී විකිණීම සඳහා හඳුනාගෙන තිබූ නමුත් සමාලෝචිත වර්ෂය අවසාන වන විටත් විකිණී නොතිබුණු මෝටර් රථ වාහන 07 කට අදාල ධාරණ අගය මූල්‍ය ප්‍රකාශනවල හෙළිදරව් කර නොතිබුණි. ප්‍රමිතයේ 21 වන ඡේදයට පටහැනිව සමාලෝචිත වර්ෂය තුලදී මෝටර් රථ හාසමුද්‍රිකා පර්යේෂණ යාත්‍රාව අළුත්වැඩියා වෙනුවෙන් වැය කරන ලද එකතුව රු.11,885,455 ක් ප්‍රාග්ධනිත ගත කර තිබුණි. ප්‍රමිත යේ 69 වන ඡේදය අනුව වත්කමක් ක්ෂය කිරීම එහි අපේක්ෂිත භාවිත තත්ත්වයට පත්වූ පසු ආරම්භ කල යුතු වුවත්, පර්යේෂණ කටයුතු සඳහා මත්ස්‍ය අභිජනනාගාරයක් ඉදිකිරීම් කටයුතු සමාලෝචිත වර්ෂය අවසාන වන විටත් අවසන් වී නොතිබියදී රු.19,791,499 ක් ගොඩනැගිලිගිණුමට ප්‍රාග්ධනිත ගත කර තිබුණි. | මෙම වරද ඉදිරියේදී නිවැරදි කිරීමට කටයුතු කරනු ලැබේ. | ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිත අංක 07 අනුව වානිජ වත්කම් සම්බන්ධයෙන් ගිණුම් තැබීම හා ක්ෂය ගණනය කිරීම සිදුකළ යුතුය. |
| (ඇ) | ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිත 08 නියෝජිතායතනය විසින් 2006 ජනවාරි සිට 2015 ඔක්තෝබර් දක්වා සේවක අර්ථසාධක ගෙවීමේදී ජීවන වියදම් දීමනාව අදාල කරගෙන නොමැති බැවින් ගෙවිය යුතු හිඟ දායක මුදල් ගෙවීම සඳහා ලබා දී තිබුණු රු.39,930,000 ක් භාණ්ඩාගාර ප්‍රතිපාදන 2017 නොවැම්බර් 22 දිනැති අංක අමප/17/2/512/725/037දරන අමාත්‍ය මණ්ඩල තීරණය අනුව ඉදිරි වර්ෂ 02 තුලදී ආයතනයේ ඉපයීම් වලින් ඒකාබද්ධ අරමුදලට ආපසු ගෙවිය යුතු වුවද ප්‍රමිතයේ 22 ඡේදය ප්‍රකාරව ඊට අදාල වෙන් කිරීම් ගිණුම්ගත කිරීම හෝ ප්‍රමිතියේ 97 ඡේදය ප්‍රකාරව අදාල හෙළිදරව් කිරීම් හෝ සිදුකර නොතිබුණි. | ආයතනය වෙත ලබාදෙනු ලබන පුනරාවර්තන ප්‍රතිපාදන හා වර්ෂයේ පුරස්කාර ආදායම් ප්‍රමාණවත් වනුයේ වර්ෂයේ වැය සඳහා පමණි. එබැවින් අතිරේක වියදමක් දැරීමට ආදායම් නොමැත. මේ අමාත්‍යාංශය යටතේ ආයතන කිහිපයක මෙම තත්ත්වය හටගෙන ඇත.මෙය නිරාකරනය කර ගැනීමට අමාත්‍යාංශය කටයුතු කරන බව විවිධ අවස්ථාවල දක්වා ඇත. එබැවින් ගෙවිය යුතු වියදමක් ලෙස පෙන්වීමට කටයුතු කර නොමැත. | අමාත්‍ය මණ්ඩල තීරණය පරිදි හා ශ්‍රී ලංකා රාජ්‍ය අංශයේ ගිණුම්කරණ ප්‍රමිත අංක 8 ප්‍රකාරව අදාළ වෙනස්කම් සිදුකිරීමට කටයුතු කළ යුතුය. |

**1.5.3 ගිණුම්කරණ ප්‍රතිපත්ති**

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| රු. 6,470,099 ක්වූ පරිගණක මෘදුකාංග අස්පෘශ්‍ය වත්කම් ලෙස මූල්‍ය ප්‍රකාශන වල හඳුනාගැනීම සඳහා ගිණුම්කරණ ප්‍රතිපත්තියක් හඳුනාගෙන නොතිබුණි. | ඉදිරි වසරේදී මෙම ප්‍රතිපත්ති සංශෝධනය කිරීමට කටයුතු කරනු ලැබේ. | අස්පෘශ්‍ය වත්කම් හඳුනා ගැනීම සඳහා අවශ්‍ය ගිණුම්කරණ ප්‍රතිපත්ති සකස් කර ඒ අනුව අදාළ හෙළිදරව් කිරීම් කළ යුතු වේ. |

**1.5.4 ගිණුම්කරණ අඩුපාඩු**

| | විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | 2014 වර්ෂයේදී ප්‍රත්‍යාගණනය කර සමාලෝචිත වර්ෂයේදී විකුණා තිබුණු මෝටර් රථ 06 ක වටිනාකම ගිණුම් වලින් ඉවත් කිරීමේදී ඒවායෙහි පිරිවැය හා සමුච්චිත ක්ෂය පිළිවෙලින් රු.4,367,100 ක් හා රු.2,269,813 ක් අඩුවෙන් ගිණුම් වලින් ඉවත් කිරීමේ ගිණුමට ගැලපීම නිසා මෝටර් රථ විකුණුම් ලාභය රු.2,096,727 ක් වැඩියෙන් මූල්‍ය කාර්යසාධන ප්‍රකාශනයේ දක්වා තිබුණු අතර එම මෝටර් රථ ප්‍රත්‍යාගණන කිරීමෙන් හඳුනාගත් රු.7,276,600 ක් වූ ප්‍රත්‍යාගණන සංචිතය මෝටර් රථ විකිණීමෙන් පසු ගිණුම් වලින් ඉවත් කර නොතිබුණි. | විගණන නිරීක්ෂණ හා එකඟ වේ. 2019 වර්ෂය සඳහා අවසාන ගිණුම් පිළියෙල කිරීමේදී මෙම වරද නිවැරදි කිරීමට පියවර ගනු ලැබේ. | ස්ථාවර වත්කම් විකිනීමේදී වත්කම විකුණන දිනට වත්කමේ ප්‍රාග්ධනිත අගය හා ක්ෂය වෙන් කිරීම නිවැරදිව හඳුනාගෙන ස්ථාවර වත්කම් විකිණීමෙන් වන අලාභය හෝ ලාභය නිවැරදිව හඳුනාගෙන නිවැරදි අගය මූල්‍ය ප්‍රකාශනවල දැක්විය යුතුය. |
| (ආ) | නියෝජිතායතනයේ ගිණුම් ප්‍රතිපත්ති මගින් රාජ්‍ය ප්‍රදාන ගිණුම්වල හඳුනා ගැනීම ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිත 20 අනුව සිදුකරන බව නියෝජිතායතනයේ ගිණුම්කරණ ප්‍රතිපත්තිවල දක්වා තිබුණද, අමාත්‍යාංශ ප්‍රදාන යටතේ 2017 සහ 2018 වර්ෂ වල මිලදී ගත් රු.6,090,164 ක් වටිනා මත්ස්‍ය ටැංකි ස්ථාවර වත්කම් සහ රාජ්‍ය ප්‍රදාන ලෙස ගිණුම් ගත කර නොතිබුණි. | විගණන නිරීක්ෂණ හා එකඟ වේ. 2019 වර්ෂය සඳහා අවසාන ගිණුම් පිළියෙල කිරීමේදී මෙම වරද නිවැරදි කිරීමට පියවර ගනු ලැබේ. | රාජ්‍ය ප්‍රදාන යටතේ ලැබෙන ප්‍රාග්ධන වත්කම් නිවැරදිව ගිණුම්ගත කර ඊට අදාළ මූල්‍ය ප්‍රකාශනය ගිණුම්වල ගැලපීමට කටයුතු කළ යුතුය. |
| (ඇ) | නියෝජිතායතනය විසින් භාවිතා කරන පනාපිටිය හා කප්පරතොට හෙක්ටයාර් 4.441 ක් වූ ඉඩම් දෙකක වටිනාකම තක්සේරු කර ගිණුම් ගත කිරීමට 2018 දෙසැම්බර් 31 දින වන විටත් කටයුතු කර නොතිබුණි. | විගණන නිරීක්ෂණ හා එකඟ වේ. 2019 වර්ෂය සඳහා අවසාන ගිණුම් පිළියෙල කිරීමේදී මෙම වරද නිවැරදි කිරීමට පියවර ගනු ලැබේ. | නියෝජිතායතනය සතු වත්කම් තක්සේරු කර ගිණුම්ගත කිරීමට පියවර ගත යුතුය. |
| (ඇ) | පූර්ව වර්ෂ වැරදි නිවැරදි කිරීමේදී 2017 වර්ෂයේ වැය කළ රු.4,810,943 ක් වූ මෝටර් රථ වාහන අළුත්වැඩියා කිරීමේ වියදම් ප්‍රාග්ධනිත ගත කිරීමේ වරද නිවැරදිකර තිබුණද ඊට අනුරූපීව හඳුනාගන්නා ලද රු.292,679 ක ක්ෂයවීම් ගිණුම් වල ගැලපුම් සිදුකර නොතිබුණි. | විගණන නිරීක්ෂණ හා එකඟ වේ. 2019 වර්ෂය සඳහා අවසාන ගිණුම් පිළියෙල කිරීමේදී මෙම වරද නිවැරදි කිරීමට පියවර ගනු ලැබේ. | ස්ථාවර වත්කම් ප්‍රාග්ධනිත කරන විට ඊට අදාළ ක්ෂයවීම්ද ගණනය කර ගිණුම්ගත කළ යුතුවේ. |

**1.5.5 නොසැසඳු පාලන ගිණුම් හෝ වාර්තා**

| විෂයය | මූල්‍ය ප්‍රකාශන අනුව වටිනාකම | අනුරූපී වාර්තා අනුව වටිනාකම | වෙනස | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|---|---|
| | රු. | රු. | රු. | | |
| ආරක්ෂක සේවා සඳහා ගෙවිය යුතු වියදම | 1,951,387 | 5,904,346 | 3,952,959 | කළමණාකරනයේ අදහස් දක්වා නැත. | ආරක්ෂක සේවා සඳහා ගෙවිය යුතු ශේෂ අදාල ආයතන සමඟ සාකච්ඡා කර නිවැරදි ශේෂ මූල්‍ය ප්‍රකාශන වල දැක්විය යුතු වේ. |

**1.5.6 විගණනය සඳහා ලිඛිත සාක්ෂි නොවීම**

| | විෂය | මුදල | නොසැපයූ විගණන සාක්ෂි | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|---|---|
| | | රු. | | | |
| (අ) | පිරියත සහ උපකරණ | 538,331 | දේපළ හා උපකරණවල ආරම්භක ශේෂයට කර තිබුණු ගැලපීම් සඳහා සියලුම ජර්නල් වවුචර් | විගණන නිරීක්ෂණ හා එකඟ වේ . 2019 වර්ෂය සඳහා අවසාන ගිණුම් පිළියෙල කිරීමේදී මෙම වරද නිවැරදි කිරීමට පියවර ගනු ලැබේ. | සියලුම ජර්නල් සටහන් සහ වවුචර් විගණනයට ඉදිරිපත් කල යුතුවේ. |
| (ආ) | වර්ෂ 02 කට වැඩි කාලයක සිට පැවතෙන උපචිත වියදම | 5,574,590 | ඉන්වොයිස් හා ශේෂ සනාථන ලියකියවිලි | විගණන නිරීක්ෂණ හා එකඟ වේ . 2019 වර්ෂය සඳහා අවසාන ගිණුම් පිළියෙල කිරීමේදී මෙම වරද නිවැරදි කිරීමට පියවර ගනු ලැබේ. | උපචිත වියදම්වල වගකීම සනාථ කිරීමට අදාල ලිඛිත සාක්ෂි ඉදිරිපත් කල යුතු වේ. |

| | | | |
|---|---|---|---|
| (ඇ) | ව්‍යාපෘති 4,246,185 ශේෂ සනාථන ණයගැතියන් ලියවිලි | විගණන නිරීක්ෂණ හා එකඟ වේ . 2019 වර්ෂය සඳහා අවසාන ගිණුම් පිළියෙල කිරීමේදී මෙම වරද නිවැරදි කිරීමට පියවර ගනු ලැබේ. | ණයගැති ශේෂ සනාථ කර ගැනීමට අදාල ලිඛිත සාක්ෂි ඉදිරිපත් කල යුතු වේ. |

### 1.5.7 ලැබිය යුතු සහ ගෙවිය යුතු ගිණුම්

| | විගණන නිරීක්ෂණය | කළමණාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | සමාලෝචිත වර්ෂයේ ව්‍යාපෘති ණයහිමි ශේෂය රු.46,826,574 ක් වූ අතර ඉන් අවුරුදු 03 වැඩි ශේෂය රු.17,902,236 ක් විය. | මෙම මුදල උපදේශන සේවා සැපයීම සඳහා ලබා ගන්නා ලද මුදල් වලින් ගෙවීම් සිදු කල පසු ඉතිරිය වේ. තවද ව්‍යාපෘතිය අවසන් වූ වහාම එය ආදායමක් ලෙස ගිණුම්ගත කිරීමට පියවර ගනු ලබන බව දක්වා තිබුණි. | දිගින් දිගටම පවතින ණයහිමි ශේෂ නිරවුල් කිරීමට ඇති වගකීම තහවුරු කරගෙන පියවීමට කටයුතු කල යුතුවේ. |
| (ආ) | උපචිත වියදම්වලින් රු.1,759,606 ක් වසර 03 ක වැඩි කාලයක සිටද, රු.5,574,593 ක් වසර 02 ත් 03 ත් අතර කාලයක සිටද නොපියවා තිබුණි. | ගෙවිය යුතු රු. 1,759,606 මුදල සම්බන්ධයෙන් කටයුතු කරන අතර , වසර 2-3 ත් කාලයක් තුල නොපියවී ඇති රු. 5,574,593 මුදල පවතින ප්‍රතිපාදන තත්ත්වය යටතේ 2018 වසරේ සිට ගෙවීම් කරමින් පවතින බව දක්වා තිබුණි. | උපචිත වියදම් වලින් තවදුරටත් ගෙවීමට ඇති වගකීම් පිළිබඳ නිවැරදිව සොයා බලා වගකීමක් පවතීනම් පමණක් ගෙවීමට කටයුතු කළ යුතුය. |
| (ඇ) | මිලදී ගැනීම් හා සේවා අත්තිකාරම් ලෙස ලබාදී තිබුණු රු.858,494 ක් වසර 02 ට වැඩි කාලයක සිටද, රු.272,160 ක් වසර 5 ක් ඉක්මවූ කාලයක සිටද පියවා නොතිබුණි. | මෙම ශේෂයන් කඩිනමින් නිරාකරණය කිරීමට කටයුතු කරන බව දක්වා තිබුණි. | මුදල් රෙගුලාසි 371 ප්‍රකාරව අදාළ කාර්යය නිමවූ වහාම අත්තිකාරම් පියවා ගැනීමට කටයුතු කළ යුතුය. |

## 1.6 නීති, රීති, රෙගුලාසි සහ කළමනාකරණ තීරණ ආදියට අනුකූල නොවීම

| | නීති, රීති, රෙගුලාසි ආදියට යොමුව | අනුකූල නොවීම | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|---|
| (අ) | ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි සංග්‍රහය | | | |
| | (i) මුදල් රෙගුලාසි 104 | | | |
| | | 2009 වර්ෂයේදී රු.411,000 කට මිලට ගෙන තිබූ පරිගණක මෘදුකාංගයක් ඇතුළත් තිබුණු පිරිවැය රු.52,000 ක් වූ පරිගණකයක් 2012 වර්ෂයේදී අස්ථානගතවී තිබීම සම්බන්ධයෙන් මුදල් රෙගුලාසිය ප්‍රකාරව කටයුතු කර නොතිබුණි. | මේ සම්බන්ධයෙන් ලබාදී ඇති තිරණ ප්‍රකාරව කටයුතු කරනු ලැබේ. | මුදල් රෙගුලාසි 104 ප්‍රකාරව කටයුතු කර යුතුවේ. |
| | (ii)මුදල් රෙගුලාසි 395 (අ) | මුදල් රෙගුලාසි 395 (අ) අනුව බැංකු ගිණුම් 3ක් සඳහා සැසඳුම් ප්‍රකාශ පිළියෙල කර නොතිබුණි. | බැංකු ගිණුම් 03 සඳහා බැංකු සැසඳුම් ප්‍රකාශ සකස් කර නොතිබුණි. මෙයට හේතුව මෙම ගිණුම් මඟින් ප්‍රේෂණය කරනු ලබන මුදල් නිශ්කාෂණය පමණකි. | මුදල් රෙගුලාසි 395 (අ) ප්‍රකාරව බැංකු ගිණුමේ සඳහන් සැසඳුම් ප්‍රකාශ සකස් කළ යුතුය. |
| | (iii) මුදල් රෙගුලාසි 757(2) | සමාලෝචිත වර්ෂයට අදාළ භාණ්ඩ සමීක්ෂණ වාර්තා විගණනය සඳහා ඉදිරිපත් කර නොතිබුණි. | භාණ්ඩ සමීක්ෂණය අවසන් කර ඇති අතර අදාල වාර්තා ඉදිරි සතිය තුල පිටපතක් විගණකාධිපති වෙත ඉදිරිපත් කිරීමට කටයුතු කරනු ලැබේ. | මුදල් රෙගුලාසි 757(2) ප්‍රකාර භාණ්ඩ සමීක්‍ෂණය කර එම වාර්තා නොපමාව විගණකාධිපති වෙත ඉදිරිපත් කළ යුතු වේ. |
| | (ආ) 2002 නොවැම්බර් 28 දිනැති අංක අයිඑ්අයි /2002/02 දරන භාණ්ඩාගාර චක්‍රලේඛය | පරිගණක, උපාංග හා මෘදුකාංග පිළිබඳ ස්ථාවර වත්කම් ලේඛනයක් පවත්වා නොතිබුණි. | මෙම වාර්තා ඉදිරියේදී හඳුන්වා දීමට කටයුතු කරනු ලැබේ. | භාණ්ඩාගාර චක්‍රලේඛයට අනුව පරිගණක හා මෘදුකාංග පිළිබඳ ස්ථාවර වත්කම් ලේඛනයක් පවත්වාගත යුතුය. |

## 2. මූල්‍ය සමාලෝචනය

### 2.1 මූල්‍ය ප්‍රතිඵල

සමාලෝචිත වර්ෂයේ මෙහෙයුම් ප්‍රතිඵලය රු. 8,532,720 ඌනතාවයක් වූ අතර ඊට අනුරූප ඉකුත් වර්ෂයේ ඌනතාවය රු. 38,665,230 ක් විය. ඒ අනුව මූල්‍ය ප්‍රතිඵලයෙහි රු. 30,132,510 ක වර්ධනයක් නිරීක්ෂණය විය. මෙම වර්ධනයට භාණ්ඩාගාර ප්‍රදාන හා වෙනත් ආදායම් රු.මිලියන 113.5 කින් වැඩිවීම ප්‍රධාන වශයෙන් හේතු වී තිබුණි.

### 2.2 ප්‍රධාන ආදායම් හා වියදම් විෂයයන්වල ප්‍රවණතා විශ්ලේෂණය

ඉකුත් වර්ෂය හා සැලකීමේදී වෙනත් මෙහෙයුම් වියදම් රු .මිලියන 20 සිට රු. මිලියන 76.5 දක්වා එනම් සියයට 73 කින් වැඩි වී තිබුණි. ගෙවිය යුතු සේවක අර්ථසාධක අරමුදල මිලියන 66 කින් වැඩිවී තිබීම ඊට ප්‍රධාන වශයෙන් බලපා තිබුණි.

## 3. මෙහෙයුම් සමාලෝචනය

### 3.1 කාර්යසාධනය

| | විගණන නිරීක්ෂණය<br>------------------------- | කළමනාකාරිත්වයේ අදහස් දැක්වීම<br>----------------------------------- | නිර්දේශය<br>------------- |
|---|---|---|---|
| **(අ)** | 1981 අංක 54 දරන ජාතික ජලජ සම්පත් හා සංවර්ධන නියෝජිතායතන පනත සහ 1996 අංක 32 දරන සංශෝධිතපනතේ 18 වන වගන්තිය ප්‍රකාර පර්යේෂණ හා සංවර්ධනය පිළිබඳව යෝජනා භාර ගැනීම හා ඇගයීම ව්‍යාපෘතීන් පිළිබඳ ප්‍රගතිය සමීක්ෂණය කිරීම සහ විද්‍යාත්මක හෝ තාක්ෂණික කරුණු සම්බන්ධයෙන් උපදෙස් ඉදිරිපත් කිරීම සඳහා නියෝජිතායතනය විසින් විද්‍යාත්මක හා තාක්ෂණික කමිටුවක් 2014 වර්ෂයේදී පත් කර තිබුණද, 2019 අප්‍රේල් වන විටත් නව සාමාජිකයින් පත් නොකර අක්‍රීය තත්ත්වයේ පැවතුණි. මේ නිසා<br>i. රටට අවශ්‍ය සහ කාලීන පර්යේෂණ තෝරා ගැනීම.<br>ii. ප්‍රතිලාභීන්ගෙන් යෝජනා ලබා ගැනීම.<br>iii. වාර්ෂිකව සිදු කරන පර්යේෂණ ව්‍යාපෘති වල කාර්ය සාධනය ඇගයීම.<br>විධිමත්ව සිදු නොවීම හේතුවෙන් ව්‍යාපෘතිවල සොයා ගැනීම් ධීවර හා ජලජ සම්පත් ක්ෂේත්‍රයේ සංවර්ධනය සඳහා ඵලදායීව යොදා ගැනීමට නොහැකි වී තිබුණි. | විද්‍යාත්මක හා තාක්ෂණ කමිටුව පිහිටුවීම සඳහා අමාත්‍යාංශයෙන් ඉල්ලීම් කර ඇත. | පනතේ විධිවිධාන අනුව කටයුතු කර ආයතනයෙන් අරමුණු ඉටුකර රටට අවශ්‍ය කාර්යසාධනය ලබාදීමට අවශ්‍ය සියලු පියවර ගත යුතු වේ. |

| | | | |
|---|---|---|---|
| (ආ) | 1981 අංක 54 දරන ජාතික ජලජ සම්පත් හා සංවර්ධන නියෝජිතායතන පනතේ 34 වගන්තිය නියෝජිතායතනය විසින් සිදුකරනු ලබන අධ්‍යයන, පර්යේෂණ, අත්හදා බැලීම්, වෙනත් විමර්ශන හා ගවේෂණ වලින් සොයා ගැනීම් වලට අදාළ දත්ත සහ වාර්තාවල විස්තර අඩංගු ලේඛනයක් අධ්‍යක්ෂ ජනරාල්වරයා විසින් පවත්වා නොගැනීම හේතුවෙන් නැවත නැවත එවැනි දෑ ඉටු කිරීමේ අවදානම මගහරවා ගැනීමට කටයුතු කර නොතිබුණි. | විද්‍යාත්මක හා තාක්ෂණ කමිටුව පිහිටුවීම සඳහා අමාත්‍යාංශයෙන් ඉල්ලීම් කර ඇත. අදාල පත් කිරීම් සිදුකල වහාම මෙම කමිටුව ක්‍රියාත්මක කිරීමට පියවර ගනු ලැබේ. තවද, පර්යේෂණයන්හි කාර්යසාධනය නියෝජ්‍ය අධ්‍යක්ෂ ජනරාල්, අධ්‍යක්ෂ ඇගයීම්, පාලක මණ්ඩලය හා රේඛීය අමාත්‍යාංශ විසින් සෑම මාස 03 කට වරක් ඇගයීමට ලක් කරන බව දන්වා සිටිමි. | පනතේ විධිවිධාන අනුව කටයුතු කල යුතුය. සීමිත සම්පතක් වන රජයේ ප්‍රතිපාදන වැය කර ඵලදායී හා කාර්යක්ෂම කාර්යයන් සඳහා යෙදීමට අවශ්‍ය සියලුම කාර්යයන් කළ යුතු වේ. |
| (ඇ) | ඛනිජ තෙල් සම්පත් සංවර්ධන ලේකම් කාර්යාලය වෙනුවෙන්සමුද්‍රීය පරිසර සමීක්ෂණ ව්‍යාපෘතියක් සිදු කිරීම සඳහා ලද රු.37,165,183 ක මුදලින් රු.2,150,000ක ගෙවීමක් විධිමත් පදනමකින් තොරව ව්‍යාපෘති සම්බන්ධීකරණ හා පරිපාලන කටයුතු වෙනුවෙන් 2018 ඔක්තෝබර් 04 දින සෘජු හා වක්‍ර කාර්ය මණ්ඩල වෙත උපදේශන සේවා සමාලෝචන කමිටුවක නිර්දේශමත ගෙවීම් සිදුකර තිබුණි.<br>මෙම කමිටුව අධ්‍යක්ෂක මණ්ඩල අනුමැතියකින් තොරව පිහිටුවා තිබුණි. | බෙදාහැරිය හැකි ලාභයෙන් ආයතනයේ අභ්‍යන්තර අනුමැතීන් මත සෘජු සේවා දායකත්වය සඳහා (60%) රු. 14,321,198 ක මුදලක් ගෙවීම් කල හැකි අතර. වක්‍ර දායකත්වය සඳහා ගෙවිය හැකි මුදල රුපියල් 2,386,868 කි<br>මින් රු. 14,275,808/- සෘජු සේවා දායකත්වය සලකා ගෙවා ඇත. වක්‍රදායකත්වය වෙනුවෙන් රු. 2,037,651 ක් ගෙවා ඇත. විගණනයෙන් පෙන්වා දෙනු ලබන රු. 2,150,000/- ක මුදල අමතර ගෙවීමක් ලෙස දක්වා ඇති අතර එය අමතර ගෙවීමක් නොව සෘජු වියදම් සඳහා ගෙවිය හැකි මුදලින් ව්‍යාපෘතියේ කටයුතු සඳහා සෘජු දායකත්වයක් දැක්වූ අංශ වල සිටින පිරිස සඳහා කල ගෙවීමකි. අභ්‍යන්තර වක්‍රලේඛනයේ 2 (එෆ්) ට අනුව එහි ඩී (11) මෙයට අදාල නොවේ. එසේම එම ගෙවීම ආයතනයේ ප්‍රධාන විධායක නිලධාරි ඇතුලු ඉහල ව්‍යාපෘති කළමණාකරන කමිටුවකින් පොදුවේ පිලිගෙන අනුමත කළ ගෙවීමකි. කමිටුව පත්කල ලිපිය අමුණා ඇත. | ගෙවීම් කිරීමේදී විධිමත් අනුමැතියක් මත ගෙවීම් කල යුතු වේ. |
| (ඈ) | බෝට්ටු 02ක් නිෂ්පාදනය කිරීම වෙනුවෙන් අයිබලැති බෝට්ටු එන්ජින් දෙකක් මිලදීගැනීම සඳහා 2011 වර්ෂයේදී රු.4,493,052 ක්ද, බෝට්ටු 02 ක් නිෂ්පාදනය කිරීමේ කටයුතු වෙනුවෙන් රු.2,902,938 ක්ද වැයකර තිබුණු නමුත් එම නිෂ්පාදන කටයුතු අතරමග නතර කර තිබුණි. | විගණන නිරීක්ෂණය හා එකඟ වී ඇත. | අවශ්‍යතාවය හඳුනාගෙන මිලදී ගැනීම් කල යුතු වේ. මෙම අවිධිමත් කාර්යයන්ට අදාළ වගකීව යුතු නිලධාරීන් හඳුනාගෙන මුදල් රෙගුලාසි ප්‍රකාර කටයුතු කළ යුතු වේ. |

## 3.2 කළමනාකරණ අකාර්යක්ෂමතා

| | විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | වෙරළාසන්න කලාපයේ පර්යේෂණ කටයුතු සඳහා 2012 වර්ෂයේදී රු.15,685,632 ක් වැය කරමින් ඉදිකර තිබූ " තරණි " යාත්‍රාව සමාලෝචිත වර්ෂය අවසානය දක්වා අදාළ කාර්යය සඳහා භාවිතා කර නොතිබුණි. 2014 නොවැම්බර් 12 දින පැවති පොදු ව්‍යාපාර කාරක සභාවේදී අදාළ යාත්‍රාව විකිණීමට කටයුතු කරන ලෙසට නියෝග කර තිබුණ නමුත් 2018 දෙසැම්බර් 31 දින වන විටත් විකුණා නොතිබුණි. කෙසේ වුවද මෙම යාත්‍රාව ඉදිකළ දිනයේ සිට සමාලෝචිත වර්ෂයේ අවසානය දක්වා යාත්‍රාවේ සේවයේ නියුතු ආරක්ෂක නිළධාරියකුගේ වැටුප්, අතිකාල දීමනා හා ආරක්ෂක කටයුතු වෙනුවෙන් රු.9,758,290 ක් වැයකර තිබුණි. | විගණන නිරීක්ෂණ හා එකඟ වේ. 2012 වර්ෂයේදී එවකට පැවති කළමනාකරණයේ තීරණය පරිදි මෙම ඉදිකිරීම සිදුකර ඇත.<br>කෙසේ වෙතත් මෙම කරුණද වසර ගණනාවක සිටම රජයේ විගණනයට භාජනය වන බැවින්, ආරක්ෂක කටයුතු සඳහා වන පිරිවැය නතර කිරීමට රු. 704,273.15 ක වියදමක් දරා 2018/08/28 දින මෙම යාත්‍රාව ප්‍රධාන කාර්යාලයට රැගෙනවිත් ඇත. | මෙම නිරීක්ෂණය දිගින් දිගටම වාර්තා කර ඇත. සීමිත සම්පතක් වන රජයේ ප්‍රතිපාදන කාර්යක්ෂමතාවයක් ගෙන ඵලදායී කාර්යයන්වල යෙදීම සඳහා අවශ්‍ය පද්ධති හා පාලන ක්‍රම හඳුන්වා දිය යුතු වේ. |
| (ආ) | 2012 ඔක්තෝබර් 04 දින නියෝජිත ආයතනයේ අධ්‍යක්ෂ මණ්ඩලය අනුමත කරන ලද අධ්‍යක්ෂ මණ්ඩල පත්‍රිකා අංක 1840 හි දක්වා නොමැති උපදේශන සේවා සමාලෝචන කමිටුවක් පත් කර, එම කමිටු සාමාජිකයන්ට නැගෙනහිර වෙරළේ භූවිද්‍යා සමීක්ෂණය සඳහා මූලික පරිසර ඇගයීම් වාර්තාවක් සැකසීම සඳහා වූ ව්‍යාපෘතියෙන් රු.125,000 ක් ගෙවා තිබුණි.<br>මෙම කමිටුව රැස්වූ බවට අදාළ රැස්වීම් වාර්තා හෝ එම කමිටුවෙහි කාර්යභාරය කුමක්ද යන්න පිළිබඳව තොරතුරු විගණනය සඳහා ඉදිරිපත් නොවුණි. එසේ තිබියදී කමිටු සාමාජිකයන් සඳහා ගෙවන ලද රු.125,000 ක් සඳහා අවම වශයෙන් ඉටුකළ කාර්යභාරය පිළිබඳ තොරතුරු අධ්‍යක්ෂ මණ්ඩල අනුමැතිය විගණනයට ඉදිරිපත් නොවුණි. | මෙම කමිටුව වෙත ගෙවීම් කර ඇත්තේ ඔවුන්ගේ කාර්යභාරය වෙනුවෙන් ව්‍යාපෘති සම්බන්ධීකාරක විසින් යෝජනා කළ ගාස්තු ප්‍රමාණයකි. මෙම කමිටු සාමාජිකයන් ඉටුකරනු ලබන්නේ මෙම ව්‍යාපෘතියේ කටයුතු වෙනුවෙන් ඍජු දායකත්වයකි. එබැවින් ගෙවීම් කිරීම සඳහා අදාල චක්‍රල්බනය ප්‍රකාරව බාධාවක් නොමැත. මෙම චක්‍රලේඛයට හා ඔබගේ ඉහත පැහැදිලි කිරීම් වලට අනුව ආයතනයේ ප්‍රධාන විධායකගේ අනුමැතිය ප්‍රමාණවත්වේ. මෙම කමිටුව ප්‍රධාන විධායක නිලධාරි විසින් පත්කර ඇති කමිටුවකි. | ගෙවීම් කිරීමේදී විධිමත් අනුමැතියක් සහිතව කළ යුතුවේ. |

## 3.3 නිෂ්කාර්ය හෝ ඌන උපයෝජිත දේපල, පිරියත හා උපකරණ

| | විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | ආපනශාලාව සඳහා මිලදීගෙන තිබූ රු.120,000 ක් වූතන්දූරි උඳුන සහ රු.352,800 ක් වූ පිඟන් සෝදන යන්ත්‍රය 2011 වර්ෂයේ සිට 2018 දෙසැම්බර් 31 දින දක්වාම භාවිතා නොකර නිෂ්කාර්යව පැවතුණි. | මෙම යන්ත්‍ර භාවිතයට ගෙන ඇත. වර්තමානයේ තව දුරටත් අලුත්වැඩියා කිරීමට නොහැකිව ඇත. | සීමිත සම්පතක් වන රජයේ ප්‍රතිපාදනය කාර්යක්‍ෂමව හා ඵලදායී කාර්යයන්වලට යෙදවිය යුතු වේ. භාවිතයට ගත නොහැකි වත්කම් තවදුරටත් ස්ථාවර වත්කම් ලෙස ගිණුම්ගතවීම ප්‍රශ්ණගතය. එවැනි දෑ භාණ්ඩ සමීක්‍ෂණය තුළින් හඳුනාගෙන ඉවත් කිරීම සඳහා අවශ්‍ය ක්‍රම හඳුන්වා දිය යුතුව ඇත. |
| (ආ) | 2014 අප්‍රේල් මාසයේදී රු.76,800 කට මිලදීගෙන තිබූ පරිගණක මෘදුකාංගයක් 2018 දෙසැම්බර් දක්වාම භාවිතා කර නොතිබුණි. | කරුණු පරීක්ෂා කිරීමේදී මෙය වර්ෂ 02 ක පමණ කාලයක් භාවිතා කර ඇත. වර්තමානයේ ගබඩාව, මිලදී ගැනීම් අංශය, ගිණුම් අංශය සම්බන්ධ කෙරෙන නව මෘදුකාංගයක් භාවිතා කරනු ලබයි. එබැවින් ගබඩාව සඳහා භාවිතාකල මෘදුකාංගය වර්තමානයේ භාවිතා නොවේ. | මෙවැනි නිරීක්‍ෂණ දිගින් දිගටම වාර්තා කර ඇත. සීමිත සම්පතක් වන රජයේ ප්‍රතිපාදන කාර්යක්‍ෂමතාවයක් ගෙන ඵලදායී කාර්යයන්වල යෙදීම සඳහා අවශ්‍ය පද්ධති හා පාලන ක්‍රම හඳුන්වා දිය යුතු වේ. |
| (ඇ) | 2016 දෙසැම්බර් 27 දින ඉවත් වී ඇති විද්‍යාඥ මහතකුගේ පශ්චාත් උපාධි මත ගිවිසුම් ගත වී ඇති බැඳුම්කරය අදාල වටිනාකම වන රු.727,166 ක මුදලක් 2016 වර්ෂයේ සිට අයකර ගැනීමට ආයතනය අපොහොසත් වී තිබුණි. | ආචාර්ය දහනායක මහතා මේ වනවිට විවෘත විශ්ව විද්‍යාලයේ පත්වීමක් ලබා එහි සේවය කරමින් සිටින බැවින්, ඔහුගේ ඇපකරයට අදාල නිත්‍ය සේවා කාලය විවෘත විශ්ව විද්‍යාලය හරහා ශ්‍රී ලංකා රජයට ලබා දීමට අවස්ථාවක් ලබා දෙන මෙන් කරන ලද ඉල්ලීම මෙම ආයතනයේ 2017.02.28 දින පැවැති 110 වන විගණන හා කළමනාකරණ කමිටුව හා 2017.05.23 දින පැවැති 05 වන පාලක මණ්ඩලය විසින් ප්‍රතික්ෂේප කර ඇත.<br>දැනට ආචාර්ය දහනායක මහතා විසින් මානව හිමිකම් කොමිෂන් සභාවේ පැමිණිල්ලක් ගොනුකර මේ වනවිට විමර්ශන කටයුතු සිදුවන බැවින් ඊට අදාල පිළිතුරු ලිපියක් ලැබෙන තෙක් ඉදිරි කටයුතු කිරීමේ හැකියාවක් නොමැති බව අවශ්‍ය කටයුතු සඳහා වාර්තා කරමි. | බැඳුම්කරයේ වටිනාකම වගකිව යුතු නිලධාරීන්ගෙන් අය කර ගත යුතු වේ. |

## 3.4 වෙනත් සංවිධාන වල සම්පත් උපයෝජනය කිරීම

| | විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | | **කල්පිටිය ප්‍රාදේශීය පර්යේෂණ මධ්‍යස්ථානය** | |
| | නියෝජිතායතනයේ කල්පිටිය පර්යේෂණ මධ්‍යස්ථානය, කප්පරතොට නාරා ප්‍රාදේශීය මධ්‍යස්ථානය හා රැකව ප්‍රාදේශීය මධ්‍යස්ථානයේ පිහිටි එකතුව රු.53,400,900 ක් වූ ඉඩම් නියෝජිතායතනය වෙත පවරා ගෙන නොතිබුණි. | පවරා ගැනීමේ කටයුතු සිදු කෙරෙමින් පවතී. | නියෝජිතායතනය විසින් සංවර්ධනය කරන ලද ඉඩම් කඩිනමින් පවරා ගැනීමට අවශ්‍ය පියවර ගත යුතුවේ. |
| | | **කප්පරතොට ප්‍රාදේශීය පර්යේෂණ මධ්‍යස්ථානය**<br>ඉඩම පැවරීමේ සහතික පත්‍ර වැලිගම ප්‍රාදේශීය ලේකම් විසින් ලියාපදිංචිය සඳහා 2019/04/29 දින මාතර ඉඩම් රෙජිස්ට්‍රාර් වෙත යොමුකර ඇත. ඉදිරි කටයුතු කෙරෙමින් පවතී. | |
| | | **රැකව ප්‍රාදේශීය පර්යේෂණ මධ්‍යස්ථානය**<br>මෙම මධ්‍යස්ථානය පවරා දීමේදී දිස්ත්‍රික් ඉඩම් පරිහරණ කමිටුව එකඟ වී ඇත්තේ දීර්ඝකාලීන බදු පදනම මත පැවරීමට වන බව දැනුම් දී ඇත. | |
| **(ආ)** | ජාතික ජලජීවී වගා සංවර්ධන අධිකාරියට අයත් පනාපිටිය ප්‍රදේශයේ පිහිටි ඉඩමක අයිතිය නියෝජිතායතනය වෙත පවරා ගැනීමෙන් තොරව ඉකුත් වර්ෂයේදී රු. 552,906 ක් වැය කර ඉදිකිරීම් සිදුකර තිබුණු අතර සමාලෝචිත වර්ෂයේදී ද එම ඉඩම පවරාගෙන නොතිබුණි. නියෝජිතායතනය වෙත විධිමත් පරිදි පවරානොගත් ඉඩමක, නියෝජිතායතනයේ අරමුණුවලින් බැහැරව රු.15,245,000 ක් 2014 වර්ෂයේදී වැය කර බේරුවල මත්ස්‍ය අලෙවි සැලක් ඉදිකර තිබුණි. | "සමාලෝචිත වසරේ දී ද මෙම ඉඩම පවරා ගැනීමට කටයුතු කර නොතිබිණි." යන්න සමග එකඟ නොවේ. 2013/05/30 දින නාරා ආයතනය හා ජාතික ජලජීවී වගා සංවර්ධන අධිකාරිය සමග ගිවිසුමේ අත්සන් කර ඇත්තේ වසර 15කට මෙම ආයතනයට ප්‍රස්තුත දේපළ පවරා දෙමිනි. එම ගිවිසුම ප්‍රකාරව පර්යේෂණ කටයුතු ආරම්භ කිරීමේ හැකියාව පවතින හෙයින් ඊට අදාල යටිතල පහසුම් සංවර්ධනය කිරීම සිදුකර ඇත. කෙසේ වෙතත් 2016/10/18 දින පැවති අමාත්‍ය මණ්ඩල රැස්වීම මගින් එකී | නියෝජිතායතනයේ අරමුණු හඳුනාගෙන එය සාක්ෂාත් කර ගැනීම සඳහා අවශ්‍ය ඉදිකිරීම් කටයුතු කිරීමටත්, ඉදිකිරීමට ප්‍රථම ඉඩමේ අයිතිය නියෝජිතායතනයට පවරා ගැනීමටත් කටයුතු කළ යුතු වේ. |

| | | |
|---|---|---|
| | දේපළ ස්ථිරවම මෙම ආයතනයට පැවරීම සඳහා අනුමැතිය ලැබීම මත එම දේපළ පවරා ගැනීම සඳහා රේඛීය අමාත්‍යාංශය වෙත සියළුම තොරතුරු සමග අදාල ඉල්ලීම ඉදිරිපත් කර ඇත.<br><br>ඒ පිළිබඳව පසු විපරම් ද සිදුකර ඇත. මේ සඳහා වෙනත් ආයතන වලින් අවශ්‍ය තොරතුරු ලැබීමේ ප්‍රමාදයද මේ සඳහා බලපා ඇත. (උදා.තක්සේරු දෙපාර්තමේන්තුවේ තක්සේරු වාර්තාව ප්‍රමාදවීම.) | |
| නිලධාරීන් තුන් දෙනෙකු රේඛීය අමාත්‍යාංශයට හා වෙනත් රජයේ ආයතන වලට මුදා හැර නියෝජිතායතනය විසින් සමාලෝචිත වර්ෂයේදී වැටුප් හා දීමනා වශයෙන් රු. 400,542 ක් ගෙවා තිබුණි. | විගණන නිරීක්ෂණ හා එකතු වේ.කෙසේ නමුත් රේඛීය අමාත්‍යාංශයෙන් ලද ඉල්ලීම මත එම අමාත්‍යාංශය වෙත මෙම නිළධාරීන් තිදෙනා නිදහස් කර තිබුණද, වසර ගණනාවක්ම මෙය රජයේ විගණනයට භාජනය වීම මත නිදහස් කිරීමේ කාලය දීර්ඝ නොකර ඔවුන් ප්‍රධාන කාර්යාලයට කැඳවා ඇත | 2003 ජුනි 02 දිනැති රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛ පීඊඩී12 හි 9:4 වගන්තිය අනුව කටයුතු කල යුතුයි. |

**3.5 මානව සම්පත් කළමනාකරණය**

| | විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | 2018 දෙසැම්බර් 31 දින වන විට පර්යේෂණ කටයුතු වලට සෘජුවම සම්බන්ධ තනතුරු 29 ක පුරප්පාඩු 116 ක් සහ සහායක සේවා තනතුරු 27 ක පුරප්පාඩු 51 ක් පැවතුණි. මෙම තනතුරු වල පුරප්පාඩු දිගින් දිගටම පැවතීම නියෝජිතායතනයේ ප්‍රධාන අරමුණු ඉටු කර ගැනීම කෙරෙහි අහිතකර ලෙස බලපාන බවද නිරීක්ෂණය විය. | නාරා ආයතනය පුරප්පාඩු සඳහා ක ළමණාකරණ සේවා දෙපාර්තමේන්තු ව විසින් අනුමත කර ඇති සමස්ථ සේවක සංඛ්‍යාව 503 වන අතර 2018 දෙසැම්බර් 31 වන විට තනතුරු 167 ක පුරප්පාඩු පැවතී ඇත. මෙම 503 ක සේවක මණ්ඩලය ඇතුලත් වී ඇත්තේ අළුතින් ආරම්භ කිරීමට නියමිත ත්‍රිකුණාමලය , පුනරීන් හා මඩකලපුව යන නව ප්‍රාදේශීය පර්යේෂණ මධ්‍යස්ථානද ඇතුළත් වන ලෙසය. | **නියෝජිතායතනයේ පවතින සේවක පුරප්පාඩු සම්පූර්ණ කිරීමට අවශ්‍ය කටයුතු කළ යුතු වේ.** |
| (ආ) | තනතුර සඳහා අවශ්‍ය මූලික සුදුසුකම් කිසිවක් සම්පූර්ණ කර නොමැති නිළධාරියෙකු මූල්‍ය අධ්‍යක්ෂ තනතුරට බඳවා ගෙන තිබූණි | අධ්‍යක්ෂක මුදල් තනතුරෙහි සේවයේ නියුතු හේවාගම මහතාගේ සුදුසුකම් වල වෙනස සම්බන්ධයෙන් නාරා පාලක මණ්ඩලය වෙත යොමු කිරීමෙන් අනතුරුව 2018 නොවැම්බර් | **බඳවා ගැනීමේ පටිපාටියට අනුව නිලධාරීන් බඳවා ගැනීමේදී, ඒ ඒ තනතුරුවලට අවශ්‍ය සුදුසුකම් හා පළපුරුද්ද මත බඳවා ගැනීමට** |

| | | |
|---|---|---|
| | මස 29 වන දින පැවති 08 වන නාරා පාලක මණ්ඩලය මගින් උපදෙස් ලබා දෙන ලද්දේ කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුවේ උපදෙස් ලබා ගන්නා ලෙසය.<br>ඒ අනුව එන්.එස් හේවාගමගේ මයා අධ්‍යක්ෂක /මුදල් තනතුරෙහි අදාල සුදුසුකම් සම්බන්ධයෙන් පාලක මණ්ඩල උපදෙස් ප්‍රකාරව සියළු කරුණු සහිතව ධීවර හා ජලජ සම්පත් සංවර්ධන අමාත්‍යාංශයේ ලේකම් මගින් කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුවේ නිර්දේශය ලබා ගැනීම සඳහා යොමු කරන ලදි.කරුණු සලකාබලන ලද කළමණා කරණ සේවා දෙපාර්තමේන්තුව 2019 මාර්තු 30 දිනැතිව පිළිතුරු යොමු කරමින් දන්වා ඇත්තේ 2013 අප්‍රේල් 12 දින අනුමත කර ඇති නාරා බඳවා ගැනීමේ පරිපාටිය අනුව, සුදුසුකම් ලෙස ශ්‍රී ලංකා වරලත් ගණකාධිකාරී ආයතනයේ හෝ වරලත් කළමනාකරණ ගණකාධිකරණ ආයතනයේ ආයතනික සාමාජිකත්වය ලබා තිබීම දක්වා ඇති අතර නමුත් හේවාගම මහතාගේ සුදුසුකම වන ශ්‍රී ලංකා වරලත් ගණකාධිකරණ ආයතනයේ රාජ්‍ය අංශයෙහි සාමාජිකත්වය එම තනතුරේ සුදුසුකමක් ලෙස අනුමත කර නොමැති බව දන්වා තිබුණි. | **අවශ්‍ය පද්ධති හා පාලන ක්‍රම සකස් කළ යුතු වේ.** |

## 4. ගිණුම්කටයුතුභාවය සහ යහපාලනය

### 4.1 මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීම

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| 2003 ජුනි 02 දිනැති අංක පීඊඩී/12 දරන රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛයේ 6.5.1 ඡේද ප්‍රකාරව මූල්‍ය වර්ෂය අවසන් වී දින 60 ක් තුළ මූල්‍ය ප්‍රකාශන විගණනය සඳහා ඉදිරිපත් කළ යුතු වුවද, නියෝජිතායතනය විසින් සමාලෝචිත වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන විගණනය සඳහා ඉදිරිපත් කරන ලද්දේ | මෙය දින 60 ක් දක්වා ප්‍රමාද වුයේ රට තුල පැවති අයහපත් වාතාවරණය මතය. එමෙන්ම මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරිමේදී කළමනාකරණ ලිපිය ඉදිරිපත් කිරීමට නොහැකි විමද මේ සඳහා බලපාන ලදී. | 2003 ජුනි 02 දිනැති අංක පීඊඩී/12 දරන රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛය අනුගමනය කර නියමිත දිනට මූල්‍ය ප්‍රකාශන විගණනයට ලබාදීම සඳහා අවශ්‍ය පද්ධති හා පාලන ක්‍රම සකස් කළ යුතු වේ. |

දින 60 ක ප්‍රමාදයක් සහිතව එනම් 2019 අප්‍රේල් 29 දිනය.

## 4.2 අභ්‍යන්තර විගණනය

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
| --- | --- | --- |
| අභ්‍යන්තර විගණන අංශය විසින්, සමාලෝචිත වර්ෂයේදී විගණන විමසුම් 23 ක් නිකුත් කර තිබූ අතර විගණන විමසුම්වල සඳහන් නිරීක්ෂණවලට අදාළව කළමණාකරණය විසින් ගත් නිවැරදි කිරීම් ක්‍රියාමාර්ග ඉදිරිපත් කර නොතිබුණි. | අභ්‍යන්තර විගණන වාර්තා සභාපතිතුමා වෙත ඉදිරිපත් කිරීමෙන් පසු අවශ්‍ය කටයුතු සිදු කිරීම සඳහා අධ්‍යක්ෂ ජනරාල්වරයාට ඉදිරිපත් කර ඇත.අධ්‍යක්ෂ ජනරාල්වරයා විසින් ඒ සඳහා නිවැරදි ක්‍රියා මාර්ග ගැනීමට අදාල අංශයන් වෙත ඉදිරිපත් කර ඇත. එම අංශ වලින් ගත් ක්‍රියාමාර්ග පිළිබඳව අධ්‍යක්ෂ ජනරාල්වරයා වෙත දැනුම් දී නොමැත. | ආයතනයේ නිවැරදි තොරතුරු ඉහළ කළමනාකරණයට ගෙන්වා ගෙන නියෝජිතායතනයෙන් රජය අපේක්ෂිත අරමුණු ඉටුකර දීමට අවශ්‍ය පද්ධති හා පාලන ක්‍රම ශක්තිමත් කිරීම සඳහා අභ්‍යන්තර විගණන අංශය ශක්තිමත් කළ යුතුව ඇත. |

## 4.3 විගණන කමිටුව

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
| --- | --- | --- |
| සමාලෝචිත වර්ෂයේදී හා ඉකුත් වර්ෂයේදී නියෝජිතායතනය විසින් විගණන හා කළමනාකරණ කමිටු රැස්වීම් වාර 03 ක් පමණක් පවත්වා තිබුණි. | අභ්‍යන්තර විගණන අංශයේ කටයුතු අභ්‍යන්තර විගණක, විගණන නිළධාරීවරියක, කළමනාකාර සහකාරවරියක සහ සේවා සහයක තනතුරක් දරන අයකු ඇතුළත්ව හතරදෙනෙකුගෙන් සමන්විත කාර්ය මණ්ඩලයක් විසින් විගණන කටයුතු සිදුකරන ලදී. ඒ අනුව ප්‍රමාණවත් කාර්ය මණ්ඩලයක් නොසිටියද, මෙම කාල සීමාව තුලදී සැලසුම් කල පරිදි විගණන වැඩ සටහන ක්‍රියාත්මක කිරීමට කටයුතු කළද, අවසන් කාර්තුවේදී පැවැත්වීමට තිබූ විගණන හා කළමනාකරණ කමිටු රැස්වීම නොවැලක්විය හැකි හේතූන් මත පැවැත්වීමට නොහැකි විය. | 2003 ජුනි 02 දිනැති අංක පීඊඩී/12 දරන රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛයට අනුව විගණන හා කළමනාකරණ කමිටු පවත්වා ආයතනයේ අරමුණු ඉටුකර ගැනීමට එය ශක්තියක් කර ගත යුතු වේ. |

## 4.4 තිරසාර සංවර්ධන අරමුණු

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
| --- | --- | --- |
| තිරසාර සංවර්ධනය පිළිබඳ එක්සත් ජාතීන්ගේ වසර 2030"න්‍යාය පත්‍රය" ප්‍රකාරව සෑම රාජ්‍ය ආයතනයක් විසින්ම කටයුතු කළ යුතුව පවතින අතර සමාලෝචිත වර්ෂයට අදාළව ජාතික ජලජ සම්පත් පර්යේෂණ හා සංවර්ධන නියෝජිතායතනය විසින් තම විෂය පථය යටතට ගැනෙන කාර්යයන් සම්බන්ධයෙන් ක්‍රියාත්මක වී ඇති බව ඊට අදාල ප්‍රශ්නාවලියෙන් දක්වා තිබුණි. එසේ වුවත් නියෝජිතායතනය විසින් එහි කාර්යයන්ට සම්බන්ධ තිරසාර සංවර්ධන අරමුණු, ඉලක්ක හා එම ඉලක්ක කරා ළඟාවිය යුතු සන්ධිස්ථානයන්ද, ඉලක්ක මත ළඟාවීම මැන බැලීම සඳහා වන දර්ශකයන්ද හඳුනා ගැනීමට කටයුතු කර නොතිබුණි. | මේ සම්බන්ධයෙන් අමාත්‍යාංශය මගින් ලබාදී ඇති උපදෙස් වලට අනුව ක්‍රියාකාරි සැලැස්ම සකසන ලදී. ඒ අනුව ඉලක්ක හා දර්ශක දක්වන ලදී. තව දුරටත් සංශෝධනය කලයුතු නම් ඉදිරියේදී කිරීමට කටයුතු කරනු ලැබේ. | එක්සත් ජාතීන්ගේ වසර 2030 න්‍යාය පත්‍රයට අනුව සෑම රාජ්‍ය ආයතනයක්ම 2030 වර්ෂයේ තිරසාර සංවර්ධනය කරා ලඟාවිය යුතුව ඇත. ඒ සඳහා අවශ්‍ය කාර්යයන් සැලසුම් කර ක්‍රියාත්මක කිරීමට අවශ්‍ය පියවර ගත යුතු වේ. |